# ගිවිසුම් හා වෙඩි සෙල්ලම්

ජනාධිපතිවරණයට පෙර සන්ධානය හා කොටි සංවිධානය අතර ගිවිසුමක් තිබුණේ ය යන්න ශ්‍රීපති සූරියාරච්චි මහතාගෙන් ප්‍රකාශවීමත් සමග දේශපාලනයේ යම් ආන්දෝලනයක් ඇතිකිරීමට එ ජා පක්ෂය උත්සාහකරන බව පෙනෙයි. එවැනි ගිවිසුමක් තිබිණි නම් ඒ ගිවිසුම පිළිබඳ ව ක්‍රියාත්මක වූවෝ කවරහු ද යන්නත් ඒ පිළිබඳ ව එකල ද දැන සිටියෝ කවරහු ද යන්නත් අපේ අවධානයට යොමු විය යුතු ය. ජනාධිපතිවරණයේ දී කොටි රනිල් වික්‍රමසිංහ මහතාට ඡන්දය නොදී ජනාධිපතිවරණය වර්ජනයකිරීමෙන් අනියමින් හෝ මහින්ද රාජපක්ෂ මහතාට සහායවීම හේතුවෙන් ගිවිසුම පිළිබඳ කතාව තවදුරටත් නොසලකා සිටිය නොහැකි කරුණක් බවට පත්වෙයි. ශ්‍රීපති සූරියාරච්චි මහතා මේ ගිවිසුම ගැන කරුණු දැක්වීමෙන් පැහැදිලිවනුයේ ඒ එතුමාගේ හුදු සිහිනයක් නොවන්නේ නම් ඒ මහතා ද ඒ පිළිබඳ කරුණු යම් ප්‍රමාණයක් හෝ දැනසිටි බව ය. එසේ නම් මංගල සමරවීර මහතාද ඒ බව දැනසිටි බව පමණක් නොව වර්තමානයෙහි එක්තරා ප්‍රසිද්ධ ඉරිදා පත්‍ර සමාගමක අධ්‍යක්ෂකවරයකු වන තම මිත්‍රයකු ඔස්සේ ප්‍රභාකරන් සමග සම්බන්ධකම් පවත්වා ගිවිසුම ඇතිකරගැනීමට කටයුතුකළ බව ද පැවසෙයි. එයට අමතරව එකල ජනාධිපතිවරණයෙහි දී වැදගත් කාර්යභාරයක් ඉටුකළ විමල් වීරසිංහ මහතා ද ඒ පිළිබඳව දැනසිටියේ ද? කෙසේ වුවත් විශාල පිරිසක් ගිවිසුම ගැන දැනසිටින්නට ඇතැයි සිතිය නො හැකි ය.

මේ ගිවිසුම පිළිබඳ ව වැඩිවිස්තර හෙළිකරන බව ශ්‍රීපති සූරියාරච්චි මහතා පවසයි. රනිල් වික්‍රමසිංහ මහතා ද ඒ ගැන නිරතුරුව ප්‍රශ්නකරයි. සූරියාරච්චි මහතා කළයුතුව ඇත්තේ තව තවත් කල් නොයවා ගිවිසුම පිළිබඳ ව තොරතුරු රටට හෙළිකිරීම ය. එවිට ගිවිසුම ඇතිකිරීමට මුල් වී යැයි සිතිය හැකි මංගල සමරවීර, ටිරාන් අලස් ආදී මහතුන්ගේ නම් ද කියැවෙනු ඇත. ගිවිසුම ගැන ආණ්ඩුව හෝ ජ වි පෙ හෝ ජාතික හෙළ උරුමය හෝ කිසිවක් කියනු ඇතැයි සිතිය නො හැකි ය. එමෙන් ම සරූියාරච්චි මහතා ද වැඩි විස්තරයක් නොකරනු ඇත්තේ එවිට ඔහුගේ සහ ඔහුගේ මිතුරන්ගේ කාර්යභාරය හෙළිදරවු වන බැවිනි. ාණ්ඩුව ද ඒ බව නොදන්නවා නො වෙයි.

ඒ ගිවිසුමෙන් ආණ්ඩුව පොරොන්දු වූයේ කුමක් ද යන්න දැනගැනීමට හැකි නම් ඒ වැදගත් ය. කොටි සංවිධානය ජනාධිපතිවරණය වර්ජනයකිරීමෙන් තමන් පොරොන්දු වූ දෙය ඉටුකර ඇති බව පෙනී යයි. කොටි සංවිධානය එවැන්නක් කරන්නේ යම් කිසිවක් බලාපොරොත්තුවෙන් බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. ඒ බලාපොරොත්තු වූ දේ ඉටුකරදීමට මංගල සමරවීර මහතා අපොහොසත්වීම ඒ මහතා ආණ්ඩුවෙන් විසිවීමට මුල් වූ කරුණ ද? කොටි සමග ජනාධිපතිවරණය සඳහා ගිවිසුමක් ඇතිකරගත්තේ නම් හා එහි දී කොටින්ට යම් පොරොන්දුවක් දුන්නේ නම් ටිරාන් අලස් මහතා මගින් ඒ කිරීමට මුල්වන්නට ඇත්තේ මංගල සමරවීර මහතා යැයි සිතිය හැකි ය. ඔහුට ජනාධිපතිවරණයෙන් රනිල් වික්‍රමසිංහ මහතා පරාජයකිරීමේ අවශ්‍යතාව තිබුණු බව නිසැක ය. ඒ අතර ඔහු ෆෙඩරල්වාදියකු බව ද අමතක නොකළ යුතු ය. වෙනත් බොහෝ දෙනකුට වඩා සුදු නෙළුම්, තවලම ආදී ව්‍යාපාරවල නිරතවූයේ ඔහු ය. කොටි සමග ගිවිසුමක් ඇතිකරගත්තේ නම් මංගල සමරවීර මහතාට එය තවත් ගිවිසුමක් පමණක් නො වී ය. ෆෙඩරල්වාදියකු වූ ඔහු ඒ සඳහා ගිවිසුමකට එහා ගොස් බැඳී සිටියේ ය.

ගිවිසුමේ කුමක් අඩංගු වුව ද ආණ්ඩුව කොටින්ට විරුද්ධව දිගින් දිගට ම හමුදා ක්‍රියා මාර්ගවල නිරතවීම ඔහුගේ සිත්ගත් කරුණක් නො වෙයි. බොරු සාම මාවතේ යැමට සූදානම් ඒ මහතාට අවශ්‍ය කොටි සමග සාකච්ඡා ඇරඹීම ය. හමුදා ක්‍රියා මාර්ග නතරකිරීමට විදේශීය තානාපතිවරු ඔහුගේ සහාය ද බලාපොරොත්තුවන්නට ඇත. පසුගිය දා ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා ඉතා වැදගත් ප්‍රකාශයක් කරමින් කියා සිටියේ ජාත්‍යන්තර ප්‍රජාව කුමක් කීවත් හමුදා ක්‍රියා මාර්ග නොනවත්වා ම කරන බව ය. මා දන්නා තරමින් ආණ්ඩුවේ වගකීමක් දරන්නකු ඊනියා ජාත්‍යන්තර ප්‍රජාව හමුදා ක්‍රියාමාර්ගවලට විරුද්ධ බව පැහැදිලිව නොව අනියම් ආකාරයකින් හෝ ප්‍රකාශකළ පළමු අවස්ථාව මෙය වෙයි. ඒ පිළිබඳ අපේ ස්තුතිය ගෝඨාභය රාජපක්ෂ මහතාට හිමි වෙයි. එමෙන් ම මුල් වටයේ දී නැගෙනහිර පළාතේ දී කොටි පරාජයකිරීමට කටයුතු කළ ත්‍රිවිධ හමුදාවන්ටත් විශේෂ කාර්ය බල සාධකයටත් අපේ ප්‍රණාමය හිමිවිය යුතු ය. මංගල සමරවීර මහතා මුල් වී ටිරාන් අලස් මහතා ඔස්සේ කොටි සමග ජනාධිපතිවරණය සඳහා ගිවිසුමක් ඇතිකරගත්තේ නම් ඒ ගිවිසුම මේ වන විට කැඩී අවසන් ය. විශේෂයෙන් ම මංගල සමරවීර මහතා (හා ශ්‍රීපති සූරියාරච්චි මහතා) ඇමතිධුරවලින් ඉවත්කිරීමෙන් පසුව එවැනි ගිවිසුමක් තිබුණ ද ඒ තවදුරටත් වලංගු

© Prof. Nalin De Silva

නො වෙයි. එබැවින් සූරියාරච්චි මහතා ගිවිසුම හෙළිකිරීමට කරන තර්ජනය පුස්සක් පමණක් වෙයි. එවැනි ගිවිසුමක් වෙතොත් ඒ ආරක්ෂාකිරීමට හෝ ඒ වෙනුවෙන් කතාකිරීමට හෝ අද ශ්‍රී ල නි පක්ෂයෙන් ඉදිරිපත්වන්නෝ මංගල සමරවීර මහතා හා ශ්‍රීපති සූරියාරච්චි මහතා පමණක් ම වෙති.

මෙරට පමණක් නොව ලොවේ හැමතැනකම පාහේ ගිවිසුම් ඇතිකරගන්නේ ම කැඩීම සඳහා ය. ගිවිසුම් යනු සදාකාලික දේ බව අපට සිතෙන්නේ යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි එසේ සිතීමට සලස්වන බැවිනි. පරණ තෙස්තමේන්තුවෙහි දැක්වෙන දෙවියන්වහන්සේ හා යුදෙව් වර්ගයා අතර වූ ගිවිසුම අනුව යමින් ගිවිසුම් සකස්විය යුතු බව ඒ සංස්කෘතියෙහි අවිඥානික ව අපට ලබාදෙන දැනුම් අතර වෙයි. තම තමන් ගිවිසුම් කැඩුව ද අනෙක් අයට ගිවිසුම් රැකීමට බලකිරීම ද ඒ සංස්කෘතියෙහි තවත් ලක්ෂණයකි. ආගමින් බෞද්ධ වුව ද මෙරට ප්‍රභූ විශාල පිරිසක් සංස්කෘතියෙන් යුදෙව් ක්‍රිස්තියානි වෙති. ගිවිසුම් පිළිබඳ අප සමාජයෙහි මෙතරම් උනන්දුවක් ඇත්තේ එබැවිනි. ගිවිසුමක් ඇතිවන්නේ යම් පසුබිමක ය. ඒ පසුබිම නැති වූ වහාම ගිවිසුම ද අහෝසි වෙයි. විරාන් අලස් මහතා ඔස්සේ මංගල සමරවීර මහතා මුල්කරගෙන ගිවිසුමක් ඇති වී නම් ඒ ගිවිසුම මෙතෙක් රැකුණත් නොරැකුණත් මංගල සමරවීර මහතා කැබිනට් මණ්ඩලයෙන් විසිවීමෙන් පසු තවදුරටත් වලංගු නො වෙයි.

කොටි සමග මහින්ද රාජපක්ෂ මහතා ඇතිකරගෙන ඇතැයි කියන ගිවිසුම පමණක් නොව ඊනියා සටන් විරාම ගිවිසුම ද අද අහෝසිය. ඒ ගිවිසුම ඇතිවූයේ රනිල් වික්‍රමසිංහ මහතා හා ප්‍රභාකරන් අතර ය. එයට නෝර්වේ රාජ්‍යය ඊනියා මැදිහත්කරුවකු වශයෙන් පමණක් නොව කෙටුම්පත්කරන්නා ආදී වශයෙන් තවත් භූමිකා ගණනාවක් ඔස්සේ සහභාගි විය. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය එයට විරුද්ධවූවා ය. එහෙත් නිල වශයෙන් විරුද්ධත්වයක් නො පෑවා ය. මහින්ද රාජපක්ෂ මහතාගේ නායකත්වයෙන් යුත් සංධානය එයට ජනාධිපතිවරණ වේදිකාවේ දී ම විරුද්ධ විය. ඒ මහතා ජනාධිපතිවීමෙන් පසුව ඒ රැකීමට කටයුතු කර නැත. ඊනියා සටන් විරාම ගිවිසුම අද වෙසගනකගේ පතිවත මෙන් ආරක්ෂා වී ඇත. ඒ සම්බන්ධයෙන් වඩාත් ම කැලඹී ඇත්තේ බටහිර බලවතුන් බව පැහැදිලි ය. ගෝඨාභය රාජපක්ෂ මහතා කියා ඇති පරිදි ම බටහිරයෝ හමුදා මෙහෙයුම් නතරකිරීමට ආණ්ඩුවට බලකරති.

පසුගිය දා ඉතාලි, ඇමරිකානු හා ජර්මන් තානාපතිවරුන් රැගත් හෙලිකොප්ටරයකට කොටි සෙල්ලම් තුවක්කුවකින් පහර දී ඇත්තේ මේ බලපෑම තවදුරටත් කිරීමට මගක් පාදාගැනීමට යැයි සිතිය හැකි ය. සෙල්ලම් තුවක්කුවකින් යැයි මා කියන්නේ ප්‍රහාරයෙන් අනතුරක් නොවන බවට කොටි වගබලාගෙන ඇති බැවිනි. කොටි මෙහි දී කියන්නට තැත්කරන ප්‍රධාන කරුණු දෙකක් වෙයි. එකක් නම් ඔවුන් නැගෙනහිර පළාතේ තවමත් ක්‍රියාකාරී බව ය. එය එතරම් බරපතල කරුණක් නො වෙයි. ප්‍රභාකරන් ඝාතනයකර හමුදා ක්‍රියාමාර්ගවලින් කොටි පරාජයකිරීමෙන් පසුව ද ටික කලක් යන තුරු කොටි ත්‍රස්තවාදී ක්‍රියා පවතිනු ඇත. එහෙත් ඉන්පසු රුවල නැති නැවකට අත්වන ඉරණම කොටි සංවිධානයට අත්වනු ඇත. ගරිල්ලා හමුදා මුළුමනින් ම පරාජය කළ නොහැකි බව කියැවෙන බටහිර දේශපාලන විද්‍යා කතන්දර තැකිය යුතු නො වෙයි. බටහිරයෝ මෙහි දී තම රටෙහි ගරිල්ලා කණ්ඩායම් හා පිටරටක ගරිල්ලා කණ්ඩායම් පරාජයකිරීම අතර වෙනස නොකියති. කොටි කියන දෙවැනි කරුණ තමන්ට තවමත් ශක්තිය ඇති නිසා හමුදා ක්‍රියාමාර්ගයෙන් ඔවුන් පරාජය කළ නොහැකි බවත් වහාම සාකච්ඡා ඇරඹිය යුතු බවත් ය. කොටි මේ දෙවැනි කරුණ කියවනු ඇත්තේ බටහිර බලවතුන් හා මෙරට සිටින යුද්ධයට විරුද්ධ ඊනියා ප්‍රබුද්ධයන් ඔස්සේ ය. යුරෝපයේ යුද්ධය තාවකාලිකව හෝ නැවැත්වූයේ යුද්ධයට විරුද්ධ වූ බ්‍රෙෂ්ට් ආදීන් නොව යුද්ධකළ චර්චිල් ය. අනෙක් පැත්තෙන් ස්ටාලින් ය. කොටි කියන්නේ තානාපතිවරුන් එන බව ආණ්ඩුව දැන්වූයේ නම් මේ සෙල්ලම නොසිදුවන බව ය. ඊනියා සටන් විරාම ගිවිසුමේ කුමක් තිබුණ ද කොටි කියන්නේ ආණ්ඩුව ඇතැම් දේ තමන්ට දැන්විය යුතු බව ය. වෙනත් වචනවලින් කිවහොත් සටන් විරාමයේ වැදගත්කම ගැන ඔවුහු අපට නැවතත් කියති. තානාපතිවරුන් ගේ ගමන පිළිබඳ ආණ්ඩුව කොටින්ට නොදැන්වුව ද බටහිර තානාපති කාර්යාල ඒ බව කොටින්ට දන්වන්නට ඇත. ඒ පිළිබඳ සැකයක් නොතිබිය යුතු ය. කොටි හෙලිකොප්ටරයට වෙඩි තැබුවේ තානාපතිවරුන් තමන්ට සෙල්ලම් වෙඩි නොතබන බව නොදැන සිටි මොහොතක යැයි විශ්වාසකිරීමට නො හැකි ය. මේ වෙඩි සෙල්ලම කෙරෙන්නට ඇත්තේ තානාපතිවරුන් නොදැනුවත් ව යැයි නො සිතමි. දැන් බටහිරයන්ට හා "ප්‍රබුද්ධයන්ට" ඊනියා සටන්විරාම ගිවිසුම හා සාකච්ඡා ගැන කතාකිරීමට තවත් පදනමක් වැටී ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva